# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

## පරිසර අමාත්‍යාංශය

# ඇබෑර්තු

## ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (කැනීම්) තනතුර

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත මගින් ස්ථාපිත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පවත්නා ඉහත සඳහන් ඇබෑර්තුව පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**බාහිර අයදුම්කරුවන් (පහත 1. හෝ 2. සමග 3. හෝ 4.)**

**අධ්‍යාපනික හා වෘත්තීමය සුදුසුකම් :**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් පතල් කැනීම් හා ඛනිජ ද්‍රව්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥතාවයෙන් යුත් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක්.
2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් භූ සම්පත් ඉංජිනේරු ක්ෂේත්‍රයේ විශේඥතාවයෙන් යුත් විද්‍යාවේදී උපාධියක්.
3) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් පතල් කැණීම් හා ඛණිජ ද්‍රව්‍ය ඉංජිනේරු / භූ සම්පත් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් (මාස්ටර්) උපාධියක්.
4) තනතුරට අදාළව, පතල් කැණීම් හා ඛනිජ ද්‍රව්‍ය ඉංජිනේරු භූ සම්පත් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය

සහ

**සේවා පළපුරුද්ද :**

පතල් කැණීම් / පතල් සුරක්ෂිතතා / පරිසර බලපෑම් ඇගයීම් / ක්ෂේත්‍රයට අදාළව සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක / ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර පහළොවක (15 ) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1හා 2)**

**අධ්‍යාපනික හා වෘත්තීය :**

1) ඉහත (1. හෝ 2. සමග 3. හෝ 4.) බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**සේවා පළපුරුද්ද :**

2) තනතුරට අදාළව පතල් කැනීම් ඉංජිනේරු / පතල් සුරක්ෂිතතා / පරිසර බලපෑම් ඇගයීම් / ප්‍රාදේශීය පරිපාලන ක්ෂේත්‍රවල ජ්‍යෙෂ්ඨ කළමනාකරන මට්ටමේ (HM 1-2) තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

අදාළ වැටුප් පරිමාණය අංක02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වේ.

HM 1-3 රුපියල් 86,865-15x2,270-120,915 + අනුමත කළ දීමනා

**වයස් සීමාව :**

අවුරුදු 35 ට නොඅඩුවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තනතුරට අදාළ පොදු කොන්දේසි :**

1. **සෑම අයදුම්කරුවෙකුම -**
   - ශ්‍රී ලාංකික පුරවැසියකු වියයුතුය.
   - තනතුරට අදාළ රාජකාරි මනා ලෙස ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීම සඳහා මනා මානසික හා ශාරීරික සුවතාවයෙන් සිටිය යුතුය.
   - විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

02. තෝරාගත් අයදුම්කරු විසින් තම වැටුපෙන් 10% ප්‍රමාණයකින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, කාර්යාංශය විසින් එම අරමුදල සඳහා 15% ක්ද, අමතරව, සේවක භාර අරමුදල (ETF) සඳහා 3% වශයෙන්ද දායකත්වයක් ලබා දෙනු ඇත.

03. රාජ්‍ය සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.

04. අයදුම්කරු පිළිබඳව කරුණු සත්‍යෙක්ෂණය සඳහා අයදුම්කරු විසින් ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නාමයන් ලිපිනයන් හා දුරකථන අංක තම අයදුම්පතෙහි සඳහන් කළ යුතුය.

05. අධ්‍යාපනික හා අනෙකුත් අදාළ සහතිකවල ඡායාපිටපත්, අදාළ අයදුම්පතට යාකොට තිබිය යුතුය.

06. **වෙනත් ප්‍රතිලාභ :**
   - රෝහල් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයට හිමිකම ඇත.
   - බාහිර රෝගී වෛද්‍ය බිල්පත් සඳහා ප්‍රතිපූරණයට හිමිකම ඇත.
   - ඉන්ධන සහිත නිල වාහනයක් හෝ වාහන දීමනාවක් සහ ප්‍රවාහන දීමනාවක් සඳහා හිමිකම ඇත.
   - වෙනත් රජයේ අනුමත දීමනා.

අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. සම්පූර්ණ කළ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත 2023.10.09 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,**
**අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.**